DOI : 10.31357/fhssmph.2004.00732

# විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය

බාලසූරිය මුදියන්සේලාගේ ප්‍රේමලතා
විසිනි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන අංශයේ දර්ශනපති (සමාජ විද්‍යා) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

දිනය :- 2004.10.01

## පර්යේෂකයාගේ ප්‍රකාශය

"විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය" නැමති මාතෘකාව යටතේ සමාජ විද්‍යා දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා මෙම නිබන්ධය ඉදිරිපත් කරමි. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අංශයේ මහාචාර්ය දයලාල් අබේසේකර මහතාගේ උපදේශකත්වය මත මා විසින් ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධයකි.

..........................................................

පර්යේෂකයාගේ අත්සන

26 SEP 2005

## උපදේශක තුමාගේ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දර්ශනපති උපාධිය සඳහා බී. එම්. ප්‍රේමලතා විසින් මාගේ උපදෙස් මත මෙම නිබන්ධය ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ලෙස සකස් කොට ඉදිරිපත් කෙරෙන්නකි. මෙම නිබන්ධය එම උපාධි අවශ්‍යතාවය සඳහා සුදුසු බව නිර්දේශ කරමි.

..............................................

උපදේශකතුමාගේ අත්සන

දිනය 22/09/2005

පිදුම

නැණ පහන්

කළ

සදාදරණීය

දෙමාපියන්ට

උපහාරයක්

විලසට

පුදන්නෙමි.

# ස්තූතිය

- ♦ මෙම නිබන්ධය ලිවීමේදී උපදෙස් ලබා දෙමින් අඩු පාඩු සකස් කර ගැනීමට මග පෙන්වූ ආචාර්ය දයලාල් අබේසේකර මහතාටත්,

- ♦ අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙමින් කටයුතු කළ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ඊ.කේ. ගණේහිගම මහතාටත්, අවශ්‍ය පොත පත සපයා දෙමින් උපකාර කළ මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහතා සහ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතාටත්, විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයටත්,

- ♦ නිබන්ධ මාතෘකාව සකස් කර ගැනීම සඳහා උපදෙස් ලබා දුන් ආචාර්ය එම්.කේ.එස්.පෙරේරා මහත්මියටත්,

- ♦ උපදෙස් ලබා දුන් කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ මහාචාර්ය රූපසිංහ මහතාටත්,

- ♦ සම්මන්ත්‍රණ කටයුතු සඳහා නොයෙක් අයුරින් මගපෙන්වූ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනි මහාචාර්ය ස්වර්ණා විජේතුංග මහත්මියටත්,

- ♦ නොයෙන් අයුරින් මෙම කාර්ය සඳහා උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කේ. බී. පෙරේරා මහත්මියටත්

- ♦ සිතියම සකසා දුන් කු/මුදුන්න මහා විද්‍යාලයේ ආචාරිණී කරුණා දසනායක මෙනෙවියටත්, ඩී. එම්. පී. ඩී. දිසානයක මෙනවියටත්, ටී. පී. වර්ණකුලසූරිය මහත්මියටත්, එච්. එම්. නාලනී චන්ද්‍රලතා මහත්මියටත්, ඩබ්ලිව්. ඒ. එම්. ස්වර්ණලතා මහත්මියටත්,

- ♦ කු/ මුදුන්න මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්,

- ♦ නොයෙක් අයුරින් සහයෝගය දැක් වූ තැඹිලිපොල විදුහලේ විජේරත්න ගුරු මහතාටත්, කු/මුදුන්න මහා විද්‍යාලයේ ආචාරිණී සෝමා බාලසූරිය සොයුරියටත්, සී.එස්.කේ. බාලසූරිය සොයුරාටත්, ජයසුන්දර මහතා සහ මගේ එකම දියණිය හෂිනි මධුෂිකා ජයසුන්දරටත්

- ♦ අවශ්‍ය තොරතුරු ලබා දෙමින් නන් අයුරින් සහයෝගය දැක් වූ මුදුන්න ගමේ ග්‍රාමසේවා නිලධාරි කිරිමුදියන්සේ තෙන්නකෝන් මහතා සහ සාමදාන විනිශ්චයකාර යූ.බී. තෙන්නකෝන් මහතාටත්, මුදුන්න ගමේ සියලු ගම් වාසීන්ටත්

- නිකවැරටිය අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තිලකරත්න සහෝදරයාටත්, පොල්ගහවෙල සමුපකාර ග්‍රාමීය බැංකුවේ ක්ෂේත්‍ර නිලධාරි සේරසිංහ සහෝදරයාටත්

- දේශක්ති විදේශ රැකියා ආයතනයේ අධිපති ප්‍රදීප් පුතා සහ හේමන්ති ජයසුන්දර දියණියටත්, රෝෂිනි වසන්ති ජයසුන්දර දියණියටත්

- සමෘද්ධි බැංකු කළමනාකාර ජයතිලක ජයසුන්දර සහෝදරයා සහ ශක්ති එන්ටප්‍රයිස්හි අධිපති ධම්මික රුවන් පුතාටත්,

මගේ ගෞරව පූර්වක ස්තුතිය,

පිළිගන්වමි.

# පටුන

## පිටුව


| | | |
|---|---|---|
| මාතෘකාව | | i |
| පර්යේෂකයාගේ ප්‍රකාශය | | i |
| උපදේශක තුමාගේ ප්‍රකාශය | | iii |
| පිදුම | | iv |
| ස්තුතිය | | v - vi |
| පටුන | | vii - xii |
| සාරාංශය | | xiii |
| හැඳින්වීම | | 01-07 |
| 1 වැනි පරිච්ඡේදය | | 08-21 |
| | අධ්‍යයන ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පසුබිම | 08 |
| 1.1 | භූගෝලීය පිහිටීම | 08 |
| 1.2 | ඓතිහාසික පසුබිම | 08-09 |
| 1.3 | ජනගහන ලක්ෂණ | 09-12 |
| 1.4 | පවුල් ක්‍රමය | 12-14 |
| 1.5 | නිවාස තත්වය | 14-16 |
| 1.6 | ආර්ථික ක්‍රියාවලිය | 16-18 |
| 1.7 | අධ්‍යාපන තත්වය | 18-19 |
| 1.8 | දේශපාලන හා පරිපාලන ව්‍යුහය | 19 |
| 1.9 | සමාජ හා සංස්කෘතික චාරිත්‍ර | 19-20 |
| 1.10 | ගම හා බාහිර ලෝකය | 21 |
| 2 වැනි පරිච්ඡේදය | | 22-53 |
| | න්‍යායාත්මක පසුබිම | |
| 2.1 | පවුල | 22-25 |

2.2 විසංවිධානාත්මක පවුල් 25-36

2.3 අධ්‍යාපන සාධනය 36-53

3 වැනි පරිච්ඡේදය 54-106

දත්ත ඉදිරිපත් කිරීම හා විග්‍රහ කිරීම

3.1 පවුලේ විසංවිධානාත්මක තත්වය නිර්ණය කිරීම 54-57

3.2 අධ්‍යාපන සාධනයේ නිර්ණායකයන් 57-59

3.3 පවුලේ විසංවිධානාත්මක තත්වය හා අධ්‍යාපන සාධනයේ විවිධ පැතිකඩ අතර පවතින සහසම්බන්ධතාවය 59-105

(i) පාසලට සිසුන් ඇතුලත් කිරීම 59-61

(ii) සිසුන්ගේ දිනපතා පාසල් පැමිණීමේ ප්‍රවනතාවය 61-64

(iii) 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල 64-68

(iv) අ. පො. ස. (සා. පෙළ) ප්‍රතිඵල 68-79

(v) විවිධ පාසල් පාදක ඇගයීම් 79-89

(vi) පෙර පාසල් අධ්‍යාපනය ලැබීමේ ප්‍රවනතාවය 89-90

(vii) පාසල් හැර යාමේ ප්‍රවනතාවය 90-92

(viii) උපකාරක පන්ති වෙත යොමුවීමේ ප්‍රවනතාවය 93-96

(ix) විවේක කාලය අධ්‍යාපන කටයුතු උදෙසා ඵලදායි ලෙස පරිභෝජනය කිරීමේ ප්‍රවනතාවය 96-99

(x) දෙමාපියන් දරුවාගේ පාසල සමඟ සම්බන්ධතා පැවැත්වීමේ ප්‍රවනතාවය 99-101

(xi) දරුවන්ට ජනප්‍රිය පාසල් තෝරා දීමේ ප්‍රවනතාවය 102-103

(xii) දරුවන්ගේ අධ්‍යාපන සාධනයට බලපාන නිවසේ ඇති පහසුකම් 104-105

3.4 දත්ත සමාලෝචනය 105-106

4 වැනි පර්විජේදය 107-127

නිගමන 107-115

යෝජනා 116-117

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 118-124

සම්මුඛ පරීක්ෂණ උපලේඛනය 125-127

## වගු, ප්‍රස්තාර හා සිතියම් විස්තර

| වගු අංකය | | පිටුව |
|---|---|---|
| 01. | මුදුන්න ගමෙහි ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව මුළු ජනගහනය සහ ප්‍රතිශත | 09 |
| 02. | මුදුන්න ගමෙහි ඉහළ, පහළ සහ මැද යන කොටස් තුනෙහි ඇති නිවාස සංඛ්‍යාව සහ ජන සංඛ්‍යාව | 10 |
| 03 | මුදුන්න ගමේ ඉහළ, පහළ සහ මැද යන කොටස් තුනෙහි ජන ගහනයේ ස්ත්‍රී/ පුරුෂ භාවයට අනුව වයස් කාණ්ඩය සහ ප්‍රතිශත | 11 |
| 04 | පහළ සහ මැද මුදුන්න යන කොටස් දෙකෙහි පවතින පවුල් ක්‍රමය පිළිබඳ සංඛ්‍යා සහ ප්‍රතිශත | 12 |
| 05 | පහළ සහ මැද මුදුන්න යන කොටස් දෙකෙහි පවුල් වල විවාහයේ නෛතික ස්වභාවය පිළිබඳව සංඛ්‍යා දත්ත සහ ප්‍රතිශත | 13 |
| 06 | පහළ සහ මැද මුදුන්න යන කොටස් දෙකෙහි පවුල් වල අසල්වැසියන් සහ පිටස්තර අය සමඟ විවාහ වී ඇති පවුල් සංඛ්‍යාව සහ ප්‍රතිශත | 14 |
| 07 | පහළ සහ මැද මුදුන්න යන කොසෙහි ස්ථිර සහ තාවකාලික නිවාස සංඛ්‍යාව සහ ප්‍රතිශත | 15 |
| 08 | පහළ සහ මැද මුදුන්න යන කොසෙහි නිවාස වල ඇති පොදු පහසුකම් | 15 |
| 09 | සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රතිශත (ලබන සහනාධාර ප්‍රමාණය අනුව) | 17 |

10 පහළ සහ මැද මුදුන්න යන කොසෙහි ළමා හා වැඩිහිටි ජනගහනයේ අධ්‍යාපන මට්ටම සහ ප්‍රතිශත 18

11 ලබාගත් ලකුණු මත විසංවිධානාත්මක තත්වය නිර්ණය කරනු ලැබූ පවුල් සංඛ්‍යාව සහ ප්‍රතිශතය 55

12 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ පාසල් යන වයසේ සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා ප්‍රතිශතය 58

13 පවුලේ විසංවිධානාත්මක තත්වය හා පාසල් යන වයසේ සිටිනා ළමුන්ගේ වයස් ව්‍යුහය 59

14 පවුලේ විසංවිධානාත්මක තත්වය හා දරුවන් පාසලට ඇතුලත් කිරීම 59

15 පවුලේ විසංවිධානාත්මක තත්වය හා සිසුන්ගේ දිනපතා පාසල් පැමිණීම සහ ප්‍රතිශත 61

16 නියැදිගත පවුල්වල විසංවිධානාත්මක තත්වය හා 2001 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ලකුණු මට්ටම් අතර ඇති සබැඳියාව 65

17 පවුල් වල විසංවිධානාත්මක තත්වය සහ එම පවුල් වල දරුවන්ගේ 2001 වර්ෂයේ අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල අතර ඇති සබැඳියාව 69

17.A 2001 වසරේ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉහත දැක්වූ ශිෂ්‍යයින් 8 දෙනා අසමාර්ථ්‍ය හා අධි සම්මාන ලැබීමේ ප්‍රවනතාව 74

18 2001 වසරේ අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍යයින් 08 දෙනා 2000 වසරේ 10 වැනි ශ්‍රේණියේ අවසාන වාර පරීක්ෂණයෙන් ලබා ඇති ලකුණු ප්‍රමාණය සහ සාමාන්‍යය 75

19 1999 වසරේ 09 වැනි ශ්‍රේණියේදී අවසාන වාර පරීක්ෂණයෙන් ඉහත ශිෂ්‍යයින් 08 දෙනා ලබාගෙන ඇති ලකුණු 76

20 1998 වසරේ 08 වැනි ශ්‍රේණියේදී අවසාන වාර පරීක්ෂණයෙන් ඉහත ශිෂ්‍යයින් 08 දෙනා ලබාගෙන ඇති ලකුණු 77

21 නියැදිගත පවුල් වල විසංවිධානාත්මක තත්වය සහ එම පවුල් වල දරුවන් 09 දෙනෙක් 2002 වසරේ 08 වැනි ශ්‍රේණියේ 01 වැනි සහ 02 වැනි වාර වලදී ගණිතය විෂය සම්බන්ධයෙන් ලබා ඇති සාධන මට්ටම් අතර ඇති සම්බන්ධතාවය 80

22 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ 08 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින් 09 දෙනෙකුගේ භාෂා හැකියාවන් පිළිබඳව පාසල් පාදක ඇගයීම් ලකුණු මට්ටම් අතර සම්බන්ධතාවය 84

23 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ එම දරුවන් පෙර පාසල් අධ්‍යාපනය ලැබීමේ ප්‍රවණතාවය 89

24 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ එම දරුවන් පාසල් හැරයාම අතර ඇති සම්බන්ධතාවය 91

25 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ එම දරුවන් උපකාරක පන්ති සඳහා යොමු වීමේ ප්‍රවණතාවය 93

26 පවුලේ විසංවිධානාත්මක තත්වය හා එම දරුවන් සිය විවේක කාලය ඉගෙනුම් කටයුතු කෙරෙහි යොදා ගැනීමේ ප්‍රවණතාවය 97

27 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ එම දරුවන්ගේ ඉගෙනුම් කටයුතු සොයා බැලීම සඳහා වසරකට එක් වතාවක් වත් පාසලට පැමිණි දෙමාපියන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය 100

28 පවුලේ විසංවිධානාත්මක තත්වය සහ එම දරුවන්ට ජනප්‍රිය පාසල් තෝරා දී ඇති ආකාරය 102

## සිතියම්

01 ක්ෂේත්‍රයේ භූගෝලීය පිහිටීම දැක්වෙන සිතියම I

02 මුදුන්න ග්‍රාමයේ සිතියම II

## ප්‍රස්තාර

01 තීරු ප්‍රස්තාරය

නියැදියේ පවුල් වල විසංවිධානාත්මක තත්වය නිර්ණය 56

02 ධ්‍රැවක ප්‍රස්තාර

01 ශ්‍රවණ පරීක්ෂණය 2002, I වාරය, පාසල් පාදක ඇගයීම, 8 වැනි ශ්‍රේණිය 86

02 ලිවීම පරීක්ෂණය 2002, I වාරය, පාසල් පාදක ඇගයීම, 8 වැනි ශ්‍රේණිය 87

03 කියවීම පරීක්ෂණය 2002, I වාරය, පාසල් පාදක ඇගයීම, 8 වැනි ශ්‍රේණිය 88

සාරාංශය

මෙම නිබන්ධයේ මාතෘකාව **"විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය"** යන්නයි. මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මුදුන්න ගමෙහි පවුල් 100 ක් අධ්‍යයන නියැදිය වශයෙන් යොදා ගැනිණි. එම පවුල් වල අභ්‍යන්තරික අරගලකාරී ස්වරූපය සැළකිල්ලට ගනිමින් ඉහළ, පහළ සහ අවම වශයෙන් විසංවිධානාත්මක ස්වරූපයන් හි තිව්‍රතාවය සහ දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපානු ඇතැයි සිතිය හැකි හේතුකාරක ගණනාවක් සසඳා බලමින් පර්යේෂණ උපන්‍යාසය වූ "විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය පහළ මට්ටමක පවති" යන්න සනාථ කළ හැකි සම්බන්ධතාවයක් තිබේදැයි සොයා බලා ඇත. පරිච්ඡේද හතරකින් යුක්තව ඉදිරිපත් කොට ඇති මෙම නිබන්ධයේ දත්ත විශ්ලේෂණය තුළින් බැසගත් නිගමනයන් හා යෝජනාවන් දරුවන්ගේ අධ්‍යාපන සාධනය තවදුරටත් සංවර්ධනය කරලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමේ දී අදාළ අංශ වලට වැදගත් වේ යැයි විශ්වාස කෙරේ.

මාතෘකාව :- විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය

නම :- බී. එම්. ප්‍රේමලතා

සාරාංශය

# හැඳින්වීම

නිබන්ධය සඳහා මා විසින් තෝරා ගත් මාතෘකාව වූයේ, "විසංවිධානාත්මක පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය" යන්නයි. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන්නකි. මේ සඳහා මා විසින් වසර දෙකක කාලයක් තුළදී එනම් 2001 - 2002 යන වර්ෂ වලදී ගමක් මුල් කරගෙන කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයක් යොදාගෙන තිබේ. මාතෘකාවට අනුව විසංවිධානාත්මක පවුල් යනුවෙන් අදහස් කර ඇත්තේ පවුලේ සාමාජිකයන් අතර පවතින අභ්‍යන්තරික අරගලකාරී ස්වරූපයයි. අධ්‍යයනයේදී මෙම පවුල් වල පවතින ගැටුම්කාරී තත්වයන් සොයා බලා එහි තීව්‍රතාවය මත ඉහළ විසංවිධානාත්මක තලයේ පසුවන පවුල්, පහළ විසංවිධානාත්මක තලයේ පසුවන පවුල් සහ අවම විසංවිධානාත්මක  තලයේ පසුවන පවුල් යනුවෙන් වර්ග කර ගන්නා ලදී. සංකල්පිත පවුල් වර්ග තුන හඳුනා වෙන් කර ගැනීම සඳහා ඒවායෙහි පවතින ගැටුම් සළකා බලමින් ඒවාට මුල් වන ප්‍රධාන හේතු කිපයක් මත නිර්ණායක සකස් කර ගෙන ඇත. ඒ අනුව ඉහළ විසංවිධානාත්මක පවුල් හඳුනා ගැනීම සඳහා කැඩී විසිරී ගිය හෝ එවැනි තත්වයකට පත්වීමේ අවදානම් මට්ටමක පසු වීම සළකා බලා තිබේ. පහළ විසංවිධානාත්මක පවුල වෙන් කර ගැනීමේදී සුළු වශයෙන් අභ්‍යන්තරික අරගල පවතින පවුල්ද ඉහත තත්වයන් අවම වූ සාමකාමී පරිසරයක් ඇති පවුල් අවම විසංවිධානාත්මක පවුල් යනුවෙන්ද හැඳින්වේ. මෙසේ පවුල් වර්ග කර තිබෙන්නේ ඒවායෙහි පවතින විසංවිධානාත්මක ස්වරූපයන් ගේ තීව්‍රතාවයන් හා දරුවන්ගේ අධ්‍යාපන සාධනය අතර සහ සම්බන්ධතාවයක් ඇති දැයි සළකා බැලීම සඳහාය.

අධ්‍යාපන සාධනය පිළිබඳව ගවේෂණය කිරීමේදී එහි දර්ශක වශයෙන් ප්‍රසිද්ධ විභාග ප්‍රතිඵල, එනම් අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස.(උසස් පෙළ), 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල, පාසල් වාර විභාග ලකුණු, ඇගයීම් ලකුණු, ලිවීමේ කියවීමේ හැකියාව, සාධන මට්ටම් පෙන්වනු ලබන ධ්‍රැවක ප්‍රස්තාර, සිසුන් පාසල් වලට ඇතුලත් කිරීම, අතර මඟ පාසල් නවතා දැමීම යනාදිය සම්බන්ධයෙන් තොරතුරු රැස් කෙරුණි. ඊට අමතරව සිසුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම කෙරෙහි වක්‍රව බලපෑ හැකි යැයි සිතිය හැකි ඉගෙනීම් කටයුතු කෙරෙහි දෙමාපියන් සොයා බලන ආකාරය, දිනපතා පාසල් පැමිණීම, විවේක කාලයන් ඉගෙනීමේ කටයුතු සඳහා යොදා ගන්නේද යන්න, දෙමාපියන්ගේ මඟ

පෙන්වීම, උපකාරක පන්ති සඳහා යොමු කිරීම, දෙමාපිය රැකියාවන්, නිවෙස් වල ඇති අධ්‍යාපන පහසුකම්, ජනප්‍රිය පාසල් තෝරා දීම යනාදි කරුණු පිළිබඳවත් අවධානය යොමු කරයි. ඉහත දක්වන ලද කරුණු සම්බන්ධයෙන් එම පවුල් වල පවතින විසංවිධානාත්මක තත්වය හා ගැලපී ඇත්තේ කෙසේද යන්න මෙම මාතෘකාව යටතේ විමර්ශනය කෙරේ.

මෙවැනි මාතෘකාවන් තෝරා ගැනීම වර්තමාන සමාජයට වඩාත් උචිත යැයි අදහස් කරමි. ලෝකයේ ඕනෑම රටක් ඒ ඒ රට වල ජීවනාලිය බඳු වූ අධ්‍යාපනය ක්‍රමවත් සැලැස්මක් උපයෝගි කර ගනිමින් විභව මානව සම්පත් රටට අවශ්‍ය පරිදි හසුරුවා ලීමට උනන්දු වෙයි. ලංකාවේ පාසල් අධ්‍යාපනය වෙනුවෙන්ද රජය විසින් විශාල මුල ධනයක් යොදවන අතර ආර්ථික සංවර්ධනයට අනුකූලව එය හැඩ ගස්වා ගැනීමේදී මුහුණපාන එක් ගැටළුවක් වනුයේ බොහෝ අවස්ථා වල එහි නාස්තියක් සිදු වීමයි. ඕනෑම සමාජයක් ගත් විට එම සමාජයේ ජනගහන සංයුතියත්, එක් එක් ජනගහන කණ්ඩායම් වල සුවිශේෂතා සහ විවිධතාත්, ඓතිහාසික වශයෙන් එම සමාජයෙහි කාලයක් තිස්සේ ගොඩ නැගී ඇති සංස්කෘතික ලක්ෂණත් අධ්‍යාපනය කෙරෙහි නොමඳ බලපෑමක් ඇති කරයි. එසේම ඓතිහාසිකව ආගමික සාධකය අධ්‍යාපනය කෙරෙහි බලපා ඇති ආකාරය බ්‍රාහ්මණ සමාජය, කතෝලික ආගම මුල් කර ගත් සමාජය, බුදු දහම පිරිවෙන් ආශ්‍රිතව ගෙන ගිය අධ්‍යාපනය යනාදියෙන් පැහැදිළි වේ.

සමාජීය වශයෙන්ද විවිධ පන්ති, ආර්ථික සාධක, දේශපාලන සාධක යනාදිය රටක අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි බලපාන තවත් හේතු සාධක කිපයකි. සමාජ විද්‍යාත්මකව බලන විට ඒ ඒ පවුල් වල ආදායම් මට්ටම පවා එම දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපෑමක් කරනු ලබයි. අඩු ආදායම් පවුල් වල ළමුන්ගේ අධ්‍යාපන තත්වය ඉහළ ආදායම් ලබන පවුල් වල ළමුන්ගේ අධ්‍යාපන තත්වයට වඩා පහළ බැසීමක් බොහෝ විට දකින්නට ලැබෙන්නකි. කොළඹ නගරය ගත් විට පැල්පත් වාසීන්ගේ අඩු ආදායම් තත්වය නිසා ඒවායේ ළමුන් අධ්‍යාපනය කෙරෙහි පෙළඹවීම ඉතාමත් අඩු වී ඇති අතර, අතර මඟ පාසල් නවතා දැමීමක්ද පැහැදිළි වේ. වර්තමානයේ අඩු ආදායම් පවුල් වල දෙමාපියන්ගෙන් වැඩි පිරිසක් රැකියා සඳහා රට හැර යාම නිසාද ඒ පවුල් වල ළමුන්ගේ අධ්‍යාපන තත්වය සහ අධ්‍යාපනය සඳහා